# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## තෙවන වාර පරීක්ෂණය - 2018

**දේශපාලන විද්‍යාව (23) - I** | **12 ශ්‍රේණිය** | කාලය පැය දෙකයි

**I පත්‍රය** (ල. 50 x 2)

❖ **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

**1.** "දේශපාලන විද්‍යාව අයත් වන්නේ සමාජ විද්‍යා ගණයට ය." මෙම ප්‍රකාශය

i. පිළිගත නොහැක ii. නිවැරදි නොවේ iii. පිළිගත හැක

iv. පැහැදිලි නැත v. කිසිවක් කිව නොහැක

**2.** දේශපාලන විද්‍යාවේ පියා වශයෙන් සැලකෙන්නේ

i. මහාචාර්ය ගානර් ii. නිකලොයි මැකියාවෙල්ලි

iii. ඇරිස්ටෝටල් iv. හැරල්ඩ් ජේ ලැස්කි

v. තෝමස් හොබ්ස්

**3.** දේශපාලන විද්‍යාව සමාජ විද්‍යා විෂයන් කිහිපයක් සමග සමීපව බැඳී ඇත. එම විෂයයන් නිවැරදිව දැක්වෙන වරණය වන්නේ

i. ඉතිහාසය, දර්ශනය, රසායන විද්‍යාව, භූගෝල විද්‍යාව

ii. නීතිය, මනෝ විද්‍යාව, දර්ශනය, භෞතික විද්‍යාව

iii. ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව,ඉතිහාසය, දර්ශනය

iv. සමාජ විද්‍යාව, නීතිය, දර්ශනය, රසායන විද්‍යාව

v. දර්ශනය, භූගෝල විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව

**4.** දේශපාලන විද්‍යාවේ විෂය ස්වභාවය නිර්වචනය කිරීම සඳහා පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් වඩාත් උචිත ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.

A. මානවයාගේ දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම

B. රාජ්‍ය හා පුරවැසියන් අතර පවතින සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම

C. බලය පිළිබඳ අධ්‍යයනය කිරීම

D. දේශපාලන නායකයන්ගේ ජීවන රටාව අධ්‍යයනය කිරීම

E. රාජ්‍යය පිළිබඳව අධ්‍යයනය කිරීම දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ ප්‍රමුඛ වූවකි

i. ABCD ii. ABCE iii. BCDE iv. ABDE v. ACDE

**5.** පෞර රාජ්‍යයට සම්බන්ධ විෂය කාරණා වලට සම්බන්ධ වූවක් නොවන්නේ මින් කුමක්ද?

i. රාජ්‍ය ස්වභාවය ii. රාජ්‍යයේ අරමුණු

iii. රාජ්‍ය පාලන ක්‍රම iv. ආණ්ඩුකරණ ක්‍රියාවලිය

v. අන්තර් ජාතික දේශපානය

**6.** දේශපාලනය කිරීම හා දේශපාලනය හැදෑරීම එකිනෙකට පරස්පර වූවක් වේ. මෙම ප්‍රකාශය

i. පිළිගත හැක ii. කිසිවක් කිව නොහැක iii. පිළිගත නොහැක

iv. පැහැදිලි නැත v. නිවැරදි නොවේ

**7.** දේශපාලන අධ්‍යයනය කිරීමට අදළ පැතිකඩ නිවැරදිව දැක්වෙන වරණය වන්නේ

i. දේශපාලන ආයතන
ii. ආණ්ඩුකරණය
iii. දේශපාලන මතවාද
iv. දේශපාලන සංස්කෘතිය
v. දේශපාලන චර්යාව

**8.** දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා පහත සඳහන් ප්‍රවේශන් භාවිතයට ගතහැක.

☺ තුලනාත්මක ප්‍රවේශය
☺ දේශපාලන අර්ථ ශාස්ත්‍රය ප්‍රවේශය
☺ චර්යාවාදී ප්‍රවේශය
☺ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය

i. පිළිගත හැක
ii. පිළිගත නොහැක
iii. සම්පූර්ණයෙන්ම නිවැරදිය
iv. කිසිවක් කිව නොහැක
v. මේ හැර වෙනත් ප්‍රවේශයන් ද ඇත

**9.** දර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශයේ පුරෝගාමීන් වශයෙන් සැලකෙන්නේ

i. ප්ලේටෝ හා ඇරිස්ටෝටල්
ii. ප්ලේටෝ හා ජෝන් ලොක්
iii. ඇරිස්ටෝටල් හා කාල් මාක්ස්
iv. තෝමස් හොබ්ස් හා ජෝන් ලොක්
v. ප්ලේටෝ හා මහත්මා ගාන්ධි

**10.** ස්ත්‍රීවාදී ප්‍රවේශය යටතේ දේශපාලන විද්‍යාවට එකතු වී ඇති සංකල්පයක් වන්නේ

A. ස්ත්‍රී පුරුෂ සමාජභාවය
B. ස්ත්‍රී පීඩනය
C. ස්ත්‍රී පුරුෂ ශ්‍රම විභජනය
E. දේශපාලන සංස්කෘතිය
D. පුරුෂ ආධිපත්‍ය

i. ABCD  ii. ACDE  iii. BCDE  iv. ABDE  v. ABCE

**11.** දේශපාලන මතවාදයක් ලෙස ලිබරල් වාදයේ ප්‍රධානතම මූලධර්මය වන්නේ පෞද්ගලික නිදහසයි. මෙම ප්‍රකාශය

i. පිළිගත හැක
ii. පිළිගත නොහැක
iii. කිසිවක් කිව නොහැක
iv. පැහැදිලි නැත
v. නිවැරදි නොවේ

**12.** 'දේශපාලනය විද්‍යාව' විෂය සමන්විත වන ක්ෂේත්‍ර නිවැරදිව දැක්වෙන වරණය වන්නේ

A. දේශපාලන දර්ශනය
B. දේශපාලන මතවාද
C. දේශපාලන න්‍යාය
D. දේශපාලන ආයතන
E. අන්තර් ජාතික වෙළඳම

i. ABCD  ii. ACDE  iii. BCDE  iv. ABDE  v. ABCE

**13.** දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය සාධකය ලෙස රාජ්‍යය දැක්විය හැක. මෙම ප්‍රකාශය

i. පිළිගත හැක
ii. පිළිගත නොහැක
iii. සම්පූර්ණ නැත
iv. අදල නැත
v. තරමක් පිළිගත හැක

**14.** නාගරික රාජ්‍ය ක්‍රමය ක්‍රියාත්මක වූයේ

i. බ්‍රිතාන්‍යයේ
ii. ග්‍රීසියේ
iii. ප්‍රංශයේ
iv. ඉන්දියාවේ
v. ඉතාලියේ

**15.** වඩාත් හොඳින් රාජ්‍යය අර්ථවත් වන නිවැරදි වරණය තෝරන්න.

A. දේශපාලන ලෙස සංවිධානය වූ මිනිස් සමාජය
B. නිශ්චිත භූමියක් තුළ පොදු යහපත සඳහා සංවිධානය වූ පිරිස
C. දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ටතම නිර්මාණය
D. ප්‍රීතිමත් දිවියක් සඳහා එකට එක් වූ කණ්ඩායම
E. මිනිසාගේ යහපත සඳහා බිහිවූ උසස්ම සංවිධානය

i. ABCD ii. ACDE iii. BCDE iv. ABDE v. ABCE

**16.** නූතන භෞමික රාජ්‍යයෙහි ප්‍රධාන අංග නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

A. නිශ්චිත දේශසීමාව B. ජාතික පදනම C. ආණ්ඩුව
D. පරමාධිපත්‍යය E. ව්‍යවස්ථාදායකය

i. ABCD ii. ABDE iii. ACDE iv. BCDE v. ABCE

**17.** එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය යටතේ ජාතික රාජ්‍ය නිර්මාණය වී ඇත. මෙම ප්‍රකාශය

i. පිළිගත හැක ii. තරමක් පිළිගත හැක iii. පැහැදිලි නැත
iv. කිසිවක් කිව නොහැක v. සම්පූර්ණයෙන් වැරදිය

**18.** ජාතක රාජ්‍යය බිහිවීම සඳහා බලපෑ සාධක ඇතුළත් නිවැරදි වරණය වන්නේ

A. වැඩවසම් ක්‍රමයේ බිඳ වැටීම B. ධනවාදයේ ආරම්භය
C. ක්‍රිස්තියානි ආගමික ප්‍රතිසංස්කරණ D. ඉංග්‍රීසි විප්ලවය
E. පුනරුදය

i. ABCD ii. ACDE iii. ABDE iv. BCDE v. ABCE

**19.** රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යායට අදාල වන්නේ

A. රාජ්‍යයේ ආරම්භය වහල් යුගයේ සිදුවිය
B. රාජ්‍යය පන්ති පීඩක උපකරණයකි
C. රාජ්‍යය සේවය කරන්නේ ධනපති පන්තියේ ආශාවන්ට පමණි
D. කොමියුනිස්ට් සමාජය තුළ රාජ්‍යය වියැකී යනු ඇත.
E. මිනිසා රාජ්‍යය වෙනුවෙන් කැපවිය යුතු වේ

i. ABCD ii. BCDE iii. ACDE iv. ABCE v. ABDE

**20.** පැසිස්ට් ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණ වන්නේ

A. තනි පුද්ගලයෙකු විසින් ගෙනයන ආඥාදායක පාලනය
B. දැඩි ජාතිවාදය
C. දේශපාලන ක්‍රියාදාමයේ සෑම මූලිකාංගයක්ම අකර්මණ්‍ය කිරීම
D. මධ්‍යගත සැලසුම් ක්‍රමයක් ක්‍රියාත්මක වීම
E. ආණ්ඩුවේ කාර්යයන් හා ව්‍යුහයන් කාර්යක්ෂම පදනමක් මත බෙදා නොතිබීම

i. ABCD ii. BCDE iii. ABDE iv. ABCE v. ACDE

**21.** නව ලිබරල්වාදී අදහස් ඉදිරිපත් කරන ලද ප්‍රධාන දේශපාලන චින්තකයන් වනුයේ
- i. ප්ලේටෝ හා ඇරිස්ටෝටල්
- ii. තෝමස් හොබ්ස් හා ජෝන් ලොක්
- iii. කාල් මාක්ස් හා පෙඩ්රික් එංගල්ස්
- iv. රොබට් නෝසික් හා පෙඩ්රක් වෝන්හයෙක්
- v. ගානර් හා ලැස්කි

**22.** යටත් විජිත රාජ්‍ය මාදිලිය වර්ධනය වූයේ
- i. 15 වැනි සියවසෙන් පසුවය
- ii. 20 වැනි සියවසෙන් පසුවය
- iii. 16 වැනි සියවසෙන් පසුවය
- iv. 17 වැනි සියවසෙන් පසුවය
- v. 19 වැනි සියවසෙන් පසුවය

**23.** සමාජ සම්මුතිවාදය ඉදිරිපත් කරන ලද්දේ
- i. තෝමස් හොබ්ස්, ජෝන් ලොක්, ජීන් ජැක්වින් රූසෝ
- ii. ප්ලේටෝ, ඇරිස්ටෝටර්, රූසෝ
- iii. තෝමස් හොබ්ස්, ජෝන් ලොක්, ගානර්
- iv. ඇරිස්ටෝටල්, තෝමස් හොබ්ස්, ගානර්
- v. හැරල්ඩ් ජේ ලැස්කි, තෝමස් හොබ්ස්, ජෝන් ලොක්

**24.** ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ ඇතුළත් වරණය තෝරන්න.
- A. රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය තනි ජාතික ආයතනයකට පවරා තිබීම
- B. ආණ්ඩු යාන්ත්‍රණය එකිනෙකට සාපේක්ෂ වශයෙන් ස්වායත්ත වූ ආණ්ඩු මට්ටම් දෙකකින් සමන්විත වීම
- C. ස්වාධිපත්‍ය බලය මුලුමනින්ම ජාතික මධ්‍යම ආණ්ඩුව වෙත පැවරී තිබීම
- D. ජාතික ව්‍යවස්ථාදයකය ඒකමණ්ඩල වාදය මත පදනම්ව සැකසී තිබීම
- E. මධ්‍යම ජාතික ආණ්ඩුව විසින් පහළ මට්ටමේ ආයතන අහෝසි කිරීමේ අධිකාරිත්වය හිමිකර ගැනීම

i. ABCD   ii. BCDE   iii. ACDE   iv. ABCE   v. ABDE

**25.** පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණ ඇතුළත් වරණය තෝරන්න.
- A. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කැබිනට් මණ්ඩලයට විධායක බලය හිමිවීම
- B. පාර්ලිමේන්තුවේ බහුතර සහාය ලබන පක්ෂයේ හෝ සන්ධානයේ නායකයා අගමැති බවට පත්වීම
- C. අගමැතිවරයා පාර්ලිමේන්තුවේ සාමාජිකයන් අතුරින් කැබිනට් මණ්ඩලය සකස් කර ගැනීම
- D. රාජ්‍ය නායකයාගේ භූමිකාව හා ආණ්ඩුවේ නායකයාගේ භූමිකාව ජනාධිපති නිලය වෙත ගොනුකර තිබීම
- E. අගමැති හා කැබිනම් මණ්ඩලය සාමූහික වශයෙන් පාර්ලිමේන්තුවට වගකීමට බැඳී තිබීම

i. ABCD   ii. BCDE   iii. ACDE   iv. ABCE   v. ABDE

★ **26 සිට 30 දක්වා ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළව ප්‍රකාශ 5ක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ 4ක් පමණි. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

**26.** ආණ්ඩුව පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන කිහිපයක් වන්නේ

A. මිනිස් සමාජය පාලනය කරන පරිපාලනය කරන සංවිධානය

B. මිනිස් සමාජය පාලනය කරන සංවිධානය

C. මිනිස් සමාජය කළමණාකරණය කරන සංවිධානය

D. රාජ්‍ය පාලනය කිරීම සඳහා සහභාගී වන පුද්ගල කණ්ඩායම අන්තර්ගත සංවිධානය

E. රාජ්‍යයේ දේශසීමාව තුළ ජීවත් වන සියලුම දෙනා නියෝජනය කරන සංවිධානය

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE

**27.** විධායකය

A. දේශපාලන හා ස්ථිර යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වේ.

B. ආණ්ඩුව යාන්ත්‍රණය මෙහෙය වන ප්‍රධාන ධාවකයා වේ

C. ඕනෑම දේශපාලන ක්‍රමයක දේශපාලන පිරමීඩයේ ඉහළම නිලය වේ

D. රාජ්‍යයේ උත්තරීතර නීති සම්පාදනය කරන ආණ්ඩුවේ බලධාරී අංශය වේ

E. කාර්යයන් ක්‍රියාවට නන්වන්නේ පොලීසිය හා රාජ්‍ය සේවය හරහාය

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE

**28.** අධිකරණය

A. දේශපාලන ක්‍රමයක පවතින උසාවි පද්ධතිය වේ

B. රාජ්‍ය නීති අර්ථකථනය කරන ආයතනය වේ

C. යුක්තිය හා සාධාරණත්වයේ ආරක්ෂකයා ලෙස සැලකේ

D. විධායකයේ ආශාවන් අනුව ක්‍රියාකළ යුතු යැයි අපේක්ෂා කෙරේ

E. පුද්ගල අයිතිවාසිකම්වල භාරකරුවා හා ආරක්ෂකයා සැලකේ

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE

**29.** ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ වනුයේ

A. ඒකීය  පරිපාලන හා අධිකරණ ක්‍රම පැවතීම

B. එක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පමණක් පැවතීම

C. කුඩා භූමි ප්‍රදේශයක් සහිත හා සජාතීය සමාජ සහිත රාජ්‍යවල යෝග්‍ය වේ

D. ද්විත්ව පුරවැසි භාවය සහිත වේ

E. තනි බල මධ්‍යස්ථානයක් වෙත ස්වාධිපති බලය ඒකරාශී වේ

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE

**30.** ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණය වන්නේ

A. එය ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාවක් මත ක්‍රියාත්මක වීම
B. ව්‍යවස්ථාදයකය හා විධායකය මත පතිත වී ඇති අධිකරණයේ ආධිපත්‍යය
C. අධිකරණයේ ස්වාධීනත්වය සහිත නීතියේ ආධිපත්‍ය පදනම් කරගත් ව්‍යවස්ථානුකූල ආණ්ඩුව
D. සංවිධානය වූ කණ්ඩායම් ක්‍රියාකාරිත්වයට හා විවිධ ආශාවන්ට නිදහස සහිත ශක්තිමත් සිවිල් සමාජය
E. පාලකයන් ජනතාවට වගකියන ක්‍රමයක් ක්‍රියාත්මක වීම

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE

★ **ප්‍රශ්න අංක 31 සිට 37 දක්වා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදළව දක්වා ඇති ප්‍රකාශ පහකි. ඉන් එකක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.**

**31.** නීතිය

i. රාජ්‍ය විසින් එහි සාමාජිකයන්ගේ හැසිරීම පිළිබඳව දක්වන සාමාන්‍ය නියම වේ
ii. කඩ කල විට දඬුවමකට යටත් වේ
iii. සුවිශේෂී අවස්ථාවන්හී දී හැරුණු විට සියලු දෙනාටම සමානව යෙදවේ
iv. සිවිල් සමාජයේ කැමැත්ත සහ අනුමැතිය සහිතව රාජ්‍ය විසින් බලාත්මක කරනු ලැබේ
v. යම් පිළිවෙතකට අනුව සැම විටම ලේඛනගත කිරීම සහ වාර්තා කිරීම කරනු ලැබේ

**32.** දේශපාලන පක්ෂ

i. බල අරගලයේ ප්‍රධාන රැගුම්කරුවන් වේ
ii. ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍යම නොවේ
iii. දේශපාලන සමාජානුයෝජන ක්‍රියාදමයේ වැදගත් නියෝජිතයන් වේ
iv. සමාජ ප්‍රතිසංස්කරණ ක්‍රියාදමයේ වැදගත් නියෝජිතයන් වේ
v. ඒක පක්ෂ හා ද්විපක්ෂ හා බහු පක්ෂ ලෙස වර්ග කරනු ලැබේ

**33.** බලපෑම් කණ්ඩායම්

i. ආශා කණ්ඩායම් ලෙසද හඳුන්වයි
ii. ආණ්ඩුවට තොරතුරු සපයන වැදගත් මූලාශ්‍ර වේ
iii. පෞද්ගලික අරමුණු ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ගෙන තිබේ
iv. බහුල ලෙස සංවිධානය කර ඇත්තේ නාගරික කම්කරුවන් විසිනි
v. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ වැදගත් ක්‍රියාකාරීන් වේ

**34.** අන්තර්ජාතික දේශපාලනය

i. ජාතීන් අතර කෙරෙන්නාවූ දේශපාලනය ලෙස ද හඳුන්වයි
ii. නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන් අතර කෙරෙන්නාවූ දේශපාලනයයි
iii. ජාතීන්ගේ බල අරගලය ලෙස ද හඳුන්වයි
iv. රාජ්‍යයන් හා අන්තර් ජාතික සංවිධාන අතර, කෙරෙන දේශපාලනයයි
v. ලෝක දේශපාලනය ලෙසද හඳුන්වයි

**35.** මානව හිමිකම්

i. දෙවියන් වහන්සේ විසින් ජනතාවට දෙන ලද අයිතීන් වේ

ii. මිනිසුන්වීම නිසාම මිනිසුන්ට හිමිවන අයිතීන් වේ

iii. විශ්වීය මෙන්ම මූලිකද වන බව පිළිගැනේ

iv. මිනිසුන්ට යහපත් ජීවිතයක් වර්ධනය කර ගැනීමට අවශ්‍යම දෙයක් ලෙස පිළිගැනේ

v. නිදහස, සාධාරණත්වයට, සමානාත්මතාවයට මග පාදන මූලික පදනම වේ

**36.** බලතල බෙදීම ප්‍රයෝජනවත් වන්නේ

i. ආණ්ඩුවේ බලය සංවරණය කිරීමටයි

ii. ආණ්ඩුව කාර්යක්ෂම කිරීමටයි

iii. මිනිසුන්ගේ නිදහස ආරක්ෂා කිරීමටයි

iv. එමගින් ඒකාධිපත්වයක් ඇතිවීම වළක්වන නිසයි

v. අධිකරණය සංවරණය කිරීමයි

**37.** ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමයක් නොවන්නේ

i. ප්‍රාරම්භක ක්‍රියාදමය තුළන් නීති සම්පාදනය සංශෝධනය ක්‍රියාවලියයි

ii. පුනරාවරත්තනය තුළින් නිලධාරීන් හා මහජන නියෝජිතයින් නැවත කැඳවීමයි

iii. ආණ්ඩුවේ වැදගත් ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් මහජන අදහස් විමසන ජනමත විචාරණයයි

iv. රටක විධායකය තේරීමට භාවිතා කරන හෙයර් ක්‍රමයයි

v. ජ්ලෙබිසයි මගින් රාජ්‍යයට දේශ සීමා ගැටළු පිළිබඳ තීරණය කිරීමයි

★ **ප්‍රශ්න අංක 38 සිට 43 දක්වා සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.**

**38.** බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ ලංකාව තුළ සිදුකළ සමාජ ආර්ථික හා දේශපාලන වෙනස්කම් කිහිපයක් වන්නේ

A. වැඩවසම් ක්‍රමය අහෝසි කිරීම

B. වාණිජ වතු වගා ක්‍රමය හඳුන්වාදීමයි

C. බටහිර අධ්‍යාපන ක්‍රමය හඳුන්වාදීමයි

D. නිදහස් ශ්‍රම වෙළඳපොලක් නිර්මාණය වීම

E. කුළ ක්‍රමය අහෝසි කිරීම

i. ABCD   ii. BCDE   iii. ABDE   iv. ACDE   v. ABCE

**39.** බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ

A. රාජකාර ක්‍රමය අහෝසි කිරීම හේතුවෙන් කුළ ක්‍රමය පරිහානියට පත්විය

B. පසුකාලීනව ජාතික ව්‍යාපාරයට නායකත්වය දුන් දේශීය ධනපති පන්තිය බිහිවිය.

C. විවෘත වෙළඳපල ක්‍රමය හඳුන්වාදීම හේතුවෙන් දේශීය ආර්ථිකය අන්තර් ජාතික වෙළඳපොළට එක් විය.

D. වගකිව යුතු ආණ්ඩුකරණ ක්‍රියාවලියක් ඇතිවිය

E. ද්විත්ව පාලන ක්‍රමයක් ඇතිවිය

i. ABCD   ii. BCDE   iii. ABDE   iv. ACDE   v. ABCE

**40.** ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය

A. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් විය

B. පුළුල් ජනතා ව්‍යාපාරයක් නොවීය

C. අරමුණු සහ අපේක්ෂා පිළිබඳ නායකයන් අතර එකඟතාවයක් නොවූ එකකි

D. පූර්ණ නිදහස ලබා ගැනීම අපේක්ෂා කළේය

E. ඉන්දියානු ජාතික ව්‍යාපාරය මෙන් බලවත් එකක් නොවීය

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE

**41.** ලංකා ජාතික සංගමය

A. සමාජයේ සෑම ආර්ථික හා සමාජ කණ්ඩායමක්ම එක්තැන්වූ ජන ව්‍යාපාරයක් විය

B. 1919 දී පිහිටුවීය

C. ඉංග්‍රීසි භාෂාව උගත් ධනවත් මධ්‍යම පන්තිකයන් විසින් නායකත්වය දැරූ ව්‍යාපාරයක් විය

D. වාර්ගික හා ප්‍රාදේශීය කණ්ඩායම් කිහිපයක එකතුවක් විය

E. අභ්‍යන්තර බෙදීම් හේතු කොට ගෙන ශක්තිමත් සංවිධානයක් නොවීය

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE

**42.** සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ඇති කළ ව්‍යවස්ථාදයකය

A. ද්විමණ්ඩලය විය

B. පාර්ලිමේන්තුව යන නිල නාමයෙන් හැඳින්විය

C. 29 (2) වග්තිය මගින් නීති පැනවීම සීමා කරන ලදි

D. පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය මූලධර්මය මත ගොඩනගන ලදි

E. නාමකරණයෙන් හා තෝරාපත් කළ මන්ත්‍රීවරුන්ගෙන් යුක්ත විය

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE

**43.** සෝල්බරි ව්‍යවස්ථාවෙන් සුළුතර අයිතිවාසිකම් උදෙසා ඇති කළ ව්‍යවස්ථා ආවරණය වන්නේ

A. 29 (2) වගන්තිය

B. අයිතිවාසිකම් පනත

C. බහුමන්ත්‍රී ඡන්ද කොට්ඨාශ

D. සෙනෙට් මණ්ඩලය පත්කිරීම

E. ස්වාධීන අධිකරණ හා රාජ්‍ය සේවය

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE

★ **ප්‍රශ්න අංක 44 සිට 50 දක්වා ඇති ප්‍රශ්න සඳහා මාතෘකාවට අදාළව ප්‍රකාශ 5ක් දක්වා ඇත. ඒවායින් ප්‍රකාශ හතරක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

**44.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ සෙනට් මණ්ඩලය
- A. මූල්‍ය කෙටුම්පත ආරම්භ කිරීමේ බලය භුක්ති වින්දේය
- B. නිලතල කාලය වසර පහකට සීමා කරන ලදි
- C. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සංවරණයක් ලෙසින් අතිකරන ලදි
- D. මුදල කෙටුම්පත් වසරකින් ප්‍රමාද කිරීමේ බලය භුක්ති වින්දේය
- E. තෝරාපත් කළ හා නාම කළ මන්ත්‍රීවරුන්ගෙන් යුක්ත විය

i. ABCD  ii. BCDE  iii. ABDE  iv. ACDE  v. ABCE

**45.** 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව
- A. බ්‍රිතාන්‍ය රැජිනගේ නායකත්වය එසේම රඳවා ගන්නා ලදි
- B. දිවයින සඳහා නව ජාතික ගීයක් හඳුන්වා දෙන ලදි
- C. ශ්‍රී ලංකාවට සංධීය ආණ්ඩු ක්‍රමයක් හඳුන්වා දුන්නේය
- D. ව්‍යවස්ථාදයකයේ පරමාධිපති බලය බෙලහීන එකක් විය
- E. ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී ස්වාධීන ජනරජයක් බවට පත් කරන ලදි

i. ABCD  ii. BCDE  iii. ABDE  iv. ACDE  v. ABCE

**46.** වාර්ගික නියෝජනය
- A. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය මගින් හඳුන්වා දුන්නේය
- B. සුළුතර ජනකොටස් විසින් අගය කළ ක්‍රමයක් විය
- C. නියෝජන මූලධර්මයක් ලෙස ලංකා ජාතික සංගමය ද පිළිගත් ක්‍රමයක් විය
- D. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් අහෝසි කළ ක්‍රමයකි
- E. ලාංකික සමාජය තුළ වර්ගවාදය උත්සන්න වීම කෙරෙහි බලපාන ලදි

i. ABCD  ii. BCDE  iii. ABDE  iv. ACDE  v. ABCE

**47.** මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
- A. 1924 දී හඳුන්වා දෙන ලදි
- B. එමඟින් වාර්ගික නියෝජන අහෝසි කරන ලදි
- C. ව්‍යවස්ථාදයක සභාවේ සංයුතිය පුළුල් කරන ලදි
- D. වගකීමෙන් බලය වෙන් කරන ලද ක්‍රමයක් විය
- E. ආණ්ඩුකාරවරයාගේ බලතල සම්බන්ධයෙන් පුළුල් වෙනසක් නොවීය

i. ABCD  ii. BCDE  iii. ABDE  iv. ACDE  v. ABCE

**48.** 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය මගින්
- A. සර්වජන ඡන්ද බලය හඳුන්වා දෙන ලදි
- B. ව්‍යවස්ථාදයක විධායක ද්විත්ව කාර්යයන් පැවරුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවක් පිහිටුවීය
- C. සාමාජිකයින් ද දෙනෙකුගෙන් යුත් අමාත්‍ය මණ්ඩලයක් හඳුන්වා දුන්නේය
- D. සාමූහික වගකීමෙන් යුක්ත වූ ක්‍රමයක් විය
- E. අධිරාජ්‍ය ආණ්ඩුව නියෝජනය කරන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙක් විය

i. ABCD  ii. BCDE  iii. ABDE  iv. ACDE  v. ABCE

**49.** සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ මූලිකාංග වූයේ

A. අගමැති හා කැබිනට් මණ්ඩලය සත්‍ය විධායකය වූ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය
B. නීති සම්පාදනයෙහිලා පූර්ණ බලය හිමි ව්‍යවස්ථාදායකයක් විය
C. බ්‍රිතාන්‍ය රාජාධිකරණය මුල් තැන ගත් අධිකරණ ක්‍රමය
D. බ්‍රිතාන්‍ය කිරීටයේ නායකත්වය සහිත ආණ්ඩු ක්‍රමය
E. රාජ්‍ය සේවය ස්වාධීන කිරීම උදෙසා ඇති කළ රාජ්‍ය සේවා කොමිෂමක් වීම.

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE

**50.** පළමු ජනරජ ව්‍යවස්ථාවේ නාමික විධායකය

A. ජනාධිපති යන නිල නාමයෙන් හැඳින්විය
B. නිලකාලය වසර පහකට සීමා විය
C. ස්වකීය කටයුතු සම්බන්ධයෙන් කිරීටයට වගකිව යුතු විය
D. ආණ්ඩුවේ නායකයා විය
E. මහජනතාව විසින් පත්කරන ලදි

i. ABCD ii. BCDE iii. ABDE iv. ACDE v. ABCE